## අගෝස්තු මාසය සඳහා සාංඝික පවුල් දින සුපුවත
### " දේව පුත්‍රභාවයේ උරුමය; පූර්ණ ප්‍රේමය අත්දැකීමයි "

01. ආරම්භක ප්‍රශංසාව -

පුබුදු ගී අංක 05 "ඥාන වීර්ය..."

02. ප්‍රශංසාවට හැදින්වීම :

**" මන්ද ඔබ ලබා ඇත්තේ නැවතත් බිය ගෙන දෙන වහල් සේවයේ තත්ත්වය නොව 'අබ්බා පියාණනී'යි අමතා යාච්ඤා කිරීමට ඉඩ ඇති පුත්‍රකම ලැබීමේ තත්ත්වයකි. අප දෙවියන් වහන්සේගේ දරුවන් බවට ශුද්ධාත්මයාණෝම අප ආත්මය හා එක්ව සාක්ෂි දරති. අප දරුවෝ නම් උරුමක්කාරයෝ ද වම්හ."** ( රෝම 8:15-17)

මනුෂ්‍ය පාපී බව උරුමකර ගනිමින් මෙලොව උපත ලද ඔබ/ මා වෙනුවෙන් දෙවියන් වහන්සේගේ ප්‍රේමය කොතරම් අසීමිත දැයි අප අපේ අත්දැකීමෙන් දනිමු. අබ්බා තාත්තේ - අබ්බා අම්මේ යැයි ඔවුන් වහන්සේව අමතන්නට ජේසු සමිඳාණන්ට හිමි අයිතියම ඔබට / මට තෑගි කරමින් පූර්ණ ප්‍රේමය අත්දකින්නට දේව පුත්‍රභාවයේ කැඳවීම උරුමකොට දී තිබීම ගැන දෙවි මහෝත්තමයාණන් පසසමු. කිසිවකුට කිසි කලක තේරුම්ගෙන අවසන් කළ නොහැකි ඒ අභිරහස පූර්ණ ප්‍රේමය ; අත්දකින්නට අප ලද භාග්‍යවන්තකම සමග අද දවසේ ප්‍රශංසාවට ඇතුළු වෙමු.

පුබුදු ගී අංක 146 "අභිරහසක් කරදා ..."

03. ආපසු බැලීම -

- **i** පසුගිය මාසය පුරා එදිනෙදා සිදුවීම්, අත්දැකීම් තුළ දෙවියන් වහන්සේගේ පිතෘක - මාතෘක ප්‍රේමය ඔබ අත්දුටුවාද? ඔබ තුළින් අන් අයට දෙවියන් වහන්සේගේ පීතෘක - මාතෘක ආදරය අත්දකින්නට හැකිවීද?
- **ii** දිව්‍ය සත්ප්‍රසාදීය සමිඳුන් කෙරෙහි ඔබ තුළ වූ පිපාසය කෙබඳුද? ඔවුන් වහන්සේ ඉදිරිපිට පෙනී සිටින්නට ඔබට හැකිවීද?
- **iii** දිව්‍ය යාගය තුළදී දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ ස්ථාපිත කරන මොහොත ඔබේ ජීවිතයේ පෙරළියක් කරන මොහොතක් බව ඔබ අත්දකින්නේද? ( ඔබ උදෙසා **වගුරුවනු ලබන** මාගේ ශරීරයයි, මාගේ රුධිරයයි.)

04. දවසේ සුපුවත:

පියකුගේ ආදරය, මවකගේ ආදරය පිළිබඳ හැඟීම මෙතෙකැයි විස්තර කිරීම, මැන දැක්වීම අසීරුය. එහෙත් පියකුගේ / මවකගේ ආදරය දැනීම කොතරම් පුදුමාකාරද? දෙවියන් වහන්සේගේ පීතෘක - මාතෘක ආදරය ද එසේ නොවන්නේද?

යෙසායා 66:13 **" මවක ඇගේ දරුවා සනසන්නාක් මෙන් මම නුඹලා සනසන්නෙමි. "**

යෙසායා 49:15 **" මවකට හැකිද, කුසේ දැරූ බිළිඳා අමතක කරන්න? හැකිද ඈට ඇගේම කිරි දරුවාට පෙම් නොකරන්න ? මවක ඇගේ දරුවා අමතක කළත් ,මම නම් කිසිදා නුඹ අමතක නොකරමි. "**

2සාමුවෙල් 7:14 **" මම ඔහුට පියෙක් වන්නෙමි ; ඔහු මට පුත්‍රයෙක් වන්නේය. ඔහු අයුතුකම් කළොත් මම පියකු මෙන් ඔහුට ඉපලෙන් දඬුවම් කරන්නෙමි. මිනිසුන් පහර දෙන සේ ඔහුට පහර දෙන්නෙමි. "**

ඉහත සඳහන් ශුද්ධ ලියවිලි පාඨ කෙතරම් වරක් භාවනා කළද, මෙනෙහි කළද එය අපට නීරස නොවන්නේ දෙවියන් වහන්සේගේ පිතෘක - මාතෘක ආදරය පිළිබඳ අත්දැකීම හැම දවසකම අලුතින් අත්දකින්නට සලස්වන නිසාය.

* දරුවකුගේ ජීවිතයේ සිදුවන සියළු අත්දැකීම් තුළදී මවකගේ ආදරය ප්‍රකාශ වන්නේ ඇගේ සවන්දීම, සංවේදී වීම, සමාව දීම, බාර ගැනීම, සනසනු ලැබීම තුළය. කෙනෙකු සුව කරන්නට, නිදහස් කරන්නට, මුදවා ගන්නට ඇගේ මාතෘක සෙනෙහස බලපායි.

* තරවටු කළද, දඬුවම් කළද පියකුගේ රැකවරණය, සුරක්ෂිතභාවය, බලා ගැනීම මවක් සිය දරුවන්ට දක්වන ප්‍රේමයට වඩා වෙනස් පිළිවලට ප්‍රේම කරන පියකුගේ ආදරය ප්‍රකාශ කරයි.

* පියාණන් වහන්සේගේ පීතෘක ප්‍රේමය - මාතෘක ප්‍රේමය අත්දකින්නට නම් අප ක්‍රිස්තුන් වහන්සේ දෙවියන් වහන්සේගේ පීතෘක - මාතෘක ආදරය ද අත්දුටු අත්දැකීම දෙස බැලිය යුතුය.

* දෙවියන් වහන්සේගේ පූර්ණ ප්‍රේමය වන පීතෘක - මාතෘක ප්‍රේමය අත්දුටු ජේසු සමිඳාණන්ගේ අත්දැකීම වූයේ, පියාණන් වහන්සේගේ කැමැත්ත උදෙසා පූජාවන්නට, නැතිවන්නට සිය කැමැත්තෙන් තමන් වහන්සේව පවරා දෙන්නට හැකි වීමයි. දෙවියන් වහන්සේගේ ප්‍රේමයෙන් කිසිවෙකුට, කිසිවකට ක්‍රිස්තුන් වහන්සේව වෙන් කරන්නට නොහැකි වූයේ කිසි මොහොතක වෙනස් නොවන දෙවියන් වහන්සේගේ පීතෘක - මාතෘක ප්‍රේමයෙන් ක්‍රිස්තුන් වහන්සේගේ ජීවිතය පූර්ණ වී තිබූ නිසාය.

05. අප දෙසට : රෝම 8:35

**" ක්‍රිස්තුන් වහන්සේගේ ප්‍රේමයෙන් අප වෙන් කළ හැකි කිසිවක් අද් ද? විපතට වත්, දුක් වේදනාවට වත්, පීඩාවට වත්, සාගින්නට වත්, දුගී බවට වත්, උවදුරට වත් කඩුවට වත් අප වෙන් කළ හැකිද ? "**

* දෙවියන් වහන්සේගේ ප්‍රේමයෙන් ක්‍රිස්තුන් වහන්සේව වෙන් කරන්නට කිසිවෙකුට, කිසිවකට නොහැකි වූයේ දෙවියන් වහන්සේගේ පීතෘක - මාතෘක ප්‍රේමයෙන් ඔවුන් වහන්සේ පිරී සිටි නිසාය. අපවද ක්‍රිස්තුන් වහන්සේගේ ප්‍රේමයෙන් කිසිවෙකුට / කිසිවකට වෙන්කළ නොහැකි වන්නේ දෙවියන් වහන්සේගේ පීතෘක - මාතෘක ප්‍රේමය අප අත්දකින තරමටය.

* පීඩාව, දුක වේදනාව, අසරණකම, දුගී බව අප ජීවිත වෙලා සිටියද පියෙකු මෙන් මවක මෙන් අපට ප්‍රේම කරන දෙවියන් වහන්සේව විශ්වාස කරන්නට අපට හැකිනම් ඒ සියල්ල තුළ දේව ආදරය අත්කින්නට අපට හැකිනම් දේව පුත්‍රභාවයේ උරුමය වන පූර්ණ ප්‍රේමය අත්දකින්නට අපටද හැකිවනු ඇත.

06. සාකච්ඡාව සඳහා :

**i** රෝම 8:35 ඔබේ ජීවිතයේ අත්දැකීම වී තිබේද?

**ii** ජේසු සමිඳුන් අත්දුටු දෙවියන් වහන්සේ පීතෘක - මාතෘක ප්‍රේමය අත්දකින්නට කැඳවීම ලැබුවෙකු ලෙස ඔබේ සාක්ෂි දැරීම කෙසේද?

07. මේ වසර පුරා, අබ්බා තාත්තේ - අබ්බා අම්මේ යැයි කියමින් දෙවි මහෝත්තමයාණන් ඇමතීමට අප ලද කැඳවීම තුළම ක්‍රිස්තුන් වහන්සේ මෙන් පූජාවෙමින්, නැතිවෙමින් දේව කැමැත්ත උදෙසා අප ජීවිතද පවරා දෙන්නට අපටද කැඳවීමක් ඇත. ඒ සඳහා අවශ්‍ය බලය පතා හතර දෙනාගේ කුඩා සංඝ තුළ ශුද්ධාත්ම ස්නාපනය පතා යාච්ඤා කරමු.

08. අවසාන ප්‍රශංසාව :

පුබුද ගී අංක 150 " ඔබෙන් තොරවූ..."

*********************

අවධානය සඳහා :

* භාග්‍යවන්ත මාතාවන් හා සක්‍රමේන්තු පිළිබඳ ඥානකාන්තිය අගෝස්තු මස 11වන ඉරිදා ප.ව.06.00 සිට 15 වන බ්‍රහස්පතින්දා දිවා ආහාරය දක්වා ශ්‍රී ප්‍රශංසාරාමයේදී පැවැත්වේ.

* ශ්‍රාවක සංඝවල වගකීම් ගන්නා සුමැදි මව්වරුන්ගේ ඥානකාන්තිය 21 වන බදාදා පෙ.ව.09.00 සිට ප.ව.04.00 දක්වා ශ්‍රී ප්‍රශංසාරාමයේදී පැවැත්වේ.